රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 21/96

මගේ අංකය :-එක්ස්ටියු/31/6
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.08.12

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**වෘත්තීය සමිති කටයුතු සඳහා සාමාජික සංඛ්‍යාව 1000 ට අඩු එහෙත් 500ට වැඩි සාමාජික පිරිසක් සිටින වෘත්තීය සමිතිවල ප්‍රධානනිලධාරියෙකුට මසකට දින දෙකක් රාජකාරි නිවාඩු ලබා දීම.**

සාමාජික සංඛ්‍යාව 1000ට අඩු , එහෙත් 500 ට වැඩි, රජයේ ලියාපදිංචි වෘත්තීය සමිතිවල, වෘත්තීය සමිත කටයුතු සඳහා එහි ප්‍රධාන නිලධාරියෙකුට මාසයකට දින දෙකක් රාජකාරි නිවාඩු ලබා දීමට රජය අනුමත කර ඇත.

02. ඒ අනුව ආයතන සංග්‍රහයේ XXV වැනි පරිච්ඡේදයේ 4:2 වගන්තිය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

> " නිලධාරියකු මුද හැරීමට නම්, සංගමයේ සාමාජිකත්වය විසිරි ඇතිවිට යටත් පිරිසෙයින් සාමාජිකයින් 1000 ක් සහ විසිරි නැති විට හෝ එක් ආයතනයකට හෝ සේවා ස්ථානයකට සීමා වී ඇති විට යටත් පිරිසෙයින් සාමාජිකයින් 1500 ක් සංගමයේ සිටිය යුතුය. සාමාජික සංඛ්‍යාව 3000 ක් ඉක්මවා සිටින සංගමයක් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු පූර්ණකාලීනව සංගමයේ කටයුතු සඳහා මුදහැරිය හැකිය. සාමාජික සංඛ්‍යාව 1000 ට අඩු එහෙත් 500 ට වැඩි රජයේ ලියාපදිංචි වෘත්තීය සමිතිවල ,වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරීන් පූර්ණකාලීනව නිදහස් නොකරන අතර, එහි ප්‍රධාන නිලධාරියකුට මසකට දින දෙකක උපරිමයකට යටත්ව එවන් කටයුතු සඳහා රාජාකාරි නිවාඩු ලබා දිය හැකිය.''

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.